**ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය -** 2022

---------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 වියාචනය කළ මතය**

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය ("මණ්ඩලය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 වියාචනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ..

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්:

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකාරීත්වය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ ව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත;

තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව;
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව; සහ
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) පහත සඳහන් හේතුන් නිසා දුර්වල පාලන පරිසරයක් පවතින බව නිරීක්ෂණය විය.<br><br>(i.) ඉහළ කළමනාකරණ තනතුරු දහයෙන් (10) තුනක් (03) වැඩබලන පදනම මත පුරවා ඇත. ඒවා නම් ප්‍රධාන විධායක නිලධාරී, සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය සහ කළමනාකරු - ප්‍රතිරක්ෂණ වේ. තවද, මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 20 දෙනෙකුගෙන් තනතුරු හයක් (06) පුරප්පාඩු වූ අතර එක් (01) තනතුරක් වැඩබලන පදනම මත පුරවන ලදී. ඇතැම් වැඩබලන තනතුරු දීර්ඝ කාලයක් අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද සම්පූර්ණ නොකළ නිලධාරීන් විසින් දරනු ලබයි. එබැවින්, ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් සංවර්ධනය කිරීමේ හැකියාව, අභ්‍යන්තර පාලන පද්ධතිය ක්‍රියාත්මක කිරීම ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සහ අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම සඳහා වන වර්ධනයන් අවම වේ. | ප්‍රධාන විධායක නිලධාරී සහ සහකාර සාමාන්‍යාධිකාරී -මූල්‍ය තනතුරු පුරප්පාඩු වී ඇත්තේ වැඩ තහනම් කරන ලද නිලධාරීන්ට එරෙහි නඩු කටයුතු හේතුවෙනි. ප්‍රධාන තනතුරු සඳහා බඳවා ගැනීමත් සමඟ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. | ප්‍රධාන කළමනාකරණ තනතුරු පිරවීමට සහ පාලන පරිසරය ශක්තිමත් කිරීමට කළමනාකාරිත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii.) | බඳවා ගැනීමේ පටිපාටියේ දක්වා ඇති වගකිව යුතු අංශ සහ එම කාර්යයන් ඉටු කිරීම සඳහා සුදුසු කුසලතා ඇති නිලධාරීන් නොමැති වීම හේතුවෙන් ජීව සණක ක්‍රියාවලිය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ඵලදායි ලෙස සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය. එබැවින්, අවදානම් කාලෝචිත ලෙස හඳුනා ගැනීම සහ එම අවදානම් අවම කිරීම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම, ජීව සණක ඇස්තමේන්තු කිරීම සඳහා නිවැරදි තොරතුරු සැපයීම ඵලදායී නොවිය හැක. | 2023-2027 සංයුක්ත සැලැස්මට අනුව ක්‍රියාකාරී අංශය ස්ථාපිත කෙරේ. කෙසේ වෙතත්, ආයුගණක කාර්ය බාහිර ආයුගණක ආයතනයකට පවරා ඇති අතර, එය දේශීය මෙන්ම ගෝලීය සන්දර්භය තුළ ප්‍රමුඛතම ක්රියාකාරී සමාගමක් වේ. මණ්ඩලය අවදානම් කළමනාකරණය සඳහා අනුකමිටුවක් පත් කර ඇති අතර එය 2023 සිට ක්‍රියාත්මක වේ. කැපවූ කාර්ය මණ්ඩලයක් සිටීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇති අතර පුරප්පාඩු පිරවීමට දැනටමත් කටයුතු කර ඇත. කෙසේ වෙතත්, ඉහත පෙන්වා දුන් පරිදි, රටේ වත්මන් තත්ත්වය සහ මණ්ඩලයේ අඩු වැටුප් පරිමාණයන් සුදුසු මානව ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීමේ කාලීන හැකියාවට අහිතකර ලෙස බලපා ඇත. මණ්ඩලය විසින් අභ්‍යන්තර පාලනය, දුර්වල අධීක්ෂණය සහ මෙහෙයවීම යන අංශවල අඩුපාඩු හඳුනාගෙන ඇත. පසුව, පද්ධති පාලනය වැඩිදියුණු කිරීම මගින් පද්ධතිය සහ මෙහෙයුම් අවදානම අවම කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. | මණ්ඩලය ඵලදායි ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සම්පත් සමඟ එම ප්‍රධාන අංශ ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමට කළමනාකාරීත්වය ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii.) | අභ්‍යන්තර විගණන කාර්යය 2020 පෙබරවාරි සිට 2021 ඔක්තෝබර් දක්වා (මාස 20) සිදු කර නොතිබුණි. පසුව, 2021 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සහකාර කළමනාකරු - පර්යේෂණ හා විශ්ලේෂණ දෙපාර්තමේන්තුව අභ්‍යන්තරව අභ්‍යන්තර විගණකවරයෙකු ලෙස පත් කර ඇත. කෙසේ වෙතත්, ඔහු 2022 සැප්තැම්බර් 20 දින සිට බලපැවැත්වෙන පරිදි ඔහුගේ පෙර තනතුරට මාරු කර ඇත්තේ කිසිදු හේතුවක් සඳහන් නොකර හෝ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකින් | අංශයේ ප්‍රධානියාගේ පුරප්පාඩුව හේතුවෙන් අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක නොවූ බවට මණ්ඩලයේ එකඟ වේ. කාර්ය මණ්ඩල ස්ථාන මාරු සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටිය අනුගමනය කරන ලදී. | අභ්‍යන්තර විගණනයේ ඵලදායී ක්‍රියාකාරිත්වය කළමනාකරණය විසින් සහතික කළ යුතුය. |

| | | |
|---|---|---|
| තොරවය. ඉන්පසුව, වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී රක්ෂණ දෙපාර්තමේන්තුවේ රක්ෂණ නිලධාරියෙකු වැඩ බලන පදනම මත 2022 සැප්තැම්බර් 20 සිට 2023 ජූලි 14 දක්වා කාලය සඳහා අභ්‍යන්තර විගණක ලෙස අභ්‍යන්තරව මාරු කර ඇත. මේ වන විට 2023 ජූලි 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගෙන තිබුණි. ඉන්පසුව, අභ්‍යන්තර විගණකවරයා ස්ථිර පදනමින් බඳවා ගැනීමෙන් පසු පළපුරුදු විගණන කාර්ය මණ්ඩලය විගණන කමිටුවේ නිර්දේශයකින් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව වෙනත් අංශ වෙත මාරු කර යවා තිබුණි. එබැවින් පසුගිය කාලය තුළ මණ්ඩලය තුළ දුර්වල අභ්‍යන්තර විගණන ක්‍රියාකාරීත්වයක ඉතිහාසයක් පැවති බව නිරීක්ෂණය විය. තවද, 2021 වර්ෂය සඳහා විගණන කමිටුව පවත්වා නොතිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා ඇත්තේ විගණන කමිටු 03ක් පමණි. එබැවින්, අභ්‍යන්තර පාලන පද්ධති සංශෝධනය සහ ඇගයීම, අවදානම් කළමනාකරණය සහ අනුකූලතා කාර්යයන් සහ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය වැනි අභ්‍යන්තර විගණන කාර්යයන් ඵලදායී ලෙස සිදු කර නොතිබුණි. | | |
| (iv.) අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමයේ සේවකයකු විසින් සිදු කරන ලද වංචාවක් 2022 ඔක්තෝබර් මාසයේදී අහම්බෙන් අනාවරණය වී ඇත. මෙම වංචාව 2018 වර්ෂයේ සිට සිදු කර ඇති අතර අභ්‍යන්තර විගණන වාර්තාවට අනුව අනාවරණය වූ මූල්‍ය | වංචාවේ පාඩුව අධිකරණ ක්‍රියාමාර්ග වලින් පසුව අයකර ගන්නා ලදී. | වංචා වැළැක්වීමට, අනාවරණය කර ගැනීමට සහ වංචා අවදානම අවම කිරීමට කළමනාකාරීත්වය විසින් අභ්‍යන්තර |

| | | | |
|---|---|---|---|
| | පාඩුව රු. 5,136,000 කි. මණ්ඩලයේ අභ්‍යන්තර විමර්ශනවලට අනුව මේ වන විට තවත් නිලධාරීන් 13 දෙනෙකු ද මෙවැනිම වංචාවන්ට සම්බන්ධ වී ඇති අතර එම මූල්‍ය අලාභයේ වටිනාකම රු. 6,572,300 ක් බව අනාවරණය වී ඇත. දැනට පාඩුව රු. 5,746,571 වංචනික පුද්ගලයින්ගෙන් අයකරගෙන ඇති අතර අධිකරණ කටයුතු තවමත් සිදුවෙමින් පවතී. කෙසේ වෙතත්, ආයෝජන ආදායම අහිමිවීම හේතුවෙන් මණ්ඩලයට සිදුවූ පාඩුව අයකර ගැනීම සඳහා වංචනිකයින්ට එරෙහිව කටයුතු කර නොතිබුණි. | | පාලන ක්‍රමවේද සහතික කළ යුතුය. |
| (ආ.) | අග්‍රහාර හිමිකම් ඉල්ලුම්පත්‍ර භාරගැනීමේ සිට හිමිකම් පියවීම දක්වා සහ අග්‍රහාර හිමිකම්වල බැරකම් හඳුනාගැනීම සඳහා, හිමිකම් කළමනාකරණය කිරීමේ ඒකාබද්ධ පද්ධතියක් මණ්ඩලයට නොතිබුණි. එබැවින්, හිමිකම් අයදුම්පත් භාරගැනීමේ අක්‍රමිකතා, හිමිකම් තොරතුරු නැතිවීම, දෝෂ නිවැරදි කිරීමේ ප්‍රමාදයන් සහ හිමිකම් සැකසීමේ අනවශ්‍ය ප්‍රමාදයන් සිදුවී තිබුණි. හිමිකම් හැසිරවීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය සහ සඵලතාවය වැඩි දියුණු කිරීම සඳහා මෑත කාලයේදී මණ්ඩලය කටයුතු කර තිබුණි. කෙසේ වෙතත්, ඉහත කී වැඩිදියුණු කිරීම්වල සාර්ථකත්වය මැන බැලීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවනු ඇත. | කෙසේ වෙතත්, අග්‍රහාර හිමිකම් අංශය ක්‍රියාත්මක වන්නේ හිමිකම් ක්‍රියාවලියේ ප්‍රථම අදියර වන හිමිකම් වගකීම් භාර ගැනීම සහ හඳුනා ගැනීම හැර ඒකාබද්ධ පද්ධතියක් මඟිනි. හිමිකම් සැකසුම් පද්ධති වෙනස් කිරීම් වල මෙම ආරම්භක අදියර 2023- 2027 ආයතනික සැලැස්මේ සලකා බැලූ අතර දැනට ප්‍රගතියක් ලබමින් පවතී. අග්‍රහාර හිමිකම් සැකසීම දැනට ORACLE පද්ධතිය භාවිතයෙන් සිදු කෙරේ. කෙසේ වෙතත්, මණ්ඩලය දැනටමත් වහාම සංවර්ධනය කළ යුතු හිඩැස් සහ ක්ෂේත්‍ර හඳුනාගෙන ඇත. ඇත්ත වශයෙන්ම, පද්ධතියේ සමහර වෙනස්කම් මෑතකදී සිදු කර ඇත. තවද මුදල් අමාත්‍යාංශයේ සහය ඇතිව, අභ්‍යන්තර පාලන ගැටළු, තොරතුරු තාක්ෂණ පාලන, තාක්ෂණික අවශ්‍යතා සහ හිමිකම් සැකසීම කඩිනම් කිරීම සඳහා ඇති හිඩැස් හඳුනා ගැනීම සඳහා විශේෂඥයෙකු සහිත කමිටුවක් පිහිටුවන ලදී. එම ක්‍රියාවට නැංවීමේ පළමු පියවර ලෙස ඇස් කණ්නාඩි හිමිකම් පෑම අන්තර්ජාලය හරහා ඉදිරිපත් කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. | අග්‍රහාර රක්ෂණ ක්‍රමය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීමට කළමනාකාරීත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ.) | වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී | මණ්ඩලය නිරීක්ෂණ සමග එකඟ වේ. මණ්ඩලය දැනට සේජ් ගිණුම්කරණ | මූල්‍ය තොරතුරු පද්ධති කාලානුරූපව |

| | | | |
|---|---|---|---|
| | අරමුදලේ (SRCC සහ Tr අරමුදල) ගනුදෙනු මූලාශ්‍ර ලේඛන භාවිතා කරමින් පැතුරුම්පත්වල සටහන් කර ඇති අතර වසර අවසානයේදී පැතුරුම් පත්වල සටහන් වූ සියලුම ගනුදෙනු අතින් සකස් කළ ලෙජරයකට පිටපත් කර විගණනයට ඉදිරිපත් කර ඇත. 2019 වර්ෂයේදී අරමුදල ගිණුම් තැබීම සඳහා භාවිතා කරන "සේජ්" ගිණුම්කරණ පද්ධතිය තුළ මෙම පහසුකම සපයා තිබුණද, එම පහසුකම වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සඳහා කාලීන පදනම මත යොදාගෙන නොතිබුණි. එබැවින්, පද්ධති දෙකෙහිම එකම දත්ත සැකසීමේදී කාර්යයේ අනුපිටපත් සහ දත්ත අනුපිටපත් කිරීමේ ඉහළ අවදානමක් සහ දෝෂ ඇතිවිය හැක එම නිසා , වැඩ වර්ජන කැරලි කෝලාහල සහ ත්‍රස්තවාදී අරමුදලෙහි මූල්‍ය තොරතුරු වල දත්ත විශ්වාසනීයත්වය පහළ මට්ටමක පවතින බව පෙනේ. | පද්ධතිය යාවත්කාලීන කරමින් සිටින අතර නුදුරු අනාගතයේදී එය අවසන් කළ හැක. | යාවත්කාලීන කිරීම සහ තොරතුරුවල විශ්වාසනීයත්වය කළමනාකරණය විසින් සහතික කළ යුතුය. |
| (ඇ.) | අග්‍රහාර සාමාන්‍ය, රිදී සහ රන් යෝජනා ක්‍රම සඳහා මූල්‍ය ප්‍රකාශනවල අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා වන දායකත්වය එක් ආදායම් අයිතමයක් ලෙස හඳුනාගෙන තිබුණි. අග්‍රහාර ආදායම් එකතු කිරීමේ ක්‍රමයේ නිසි සහ යාවත්කාලීන දත්ත ගබඩාවක් හෝ නිසි යාන්ත්‍රණයක් සහ සැසඳුම් ක්‍රියාවලියක් නොතිබුණි. එබැවින්, එක් එක් අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රම සඳහා කරන ලද දායක මුදල් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සහ එක් එක් ආයතනය සහ එක් එක් රක්ෂණ ඔප්පුහිමියන් විසින් අරමුදලට කරන ලද මාසික දායක මුදල් පිළිබඳ සවිස්තර වාර්තාවක් | සවිස්තරාත්මක යාවත්කාලීන දත්ත පදනමක් නොමැතිකම යන පදනම මත නිරීක්ෂණ සමග එකඟ විය. කෙසේ වෙතත්, පවතින ක්‍රමය තුළ, ආයතන කිහිපයක් හැර අග්‍රහාර සාමාන්‍ය, රිදී සහ රන් වාරික වෙන වෙනම ලබා දිය හැකිය. කෙසේ වෙතත් මුදල් අමාත්‍යාංශයේ අනුග්‍රහය ඇතිව නව සවිස්තරාත්මක තොරතුරු පද්ධතියක් 2022 දෙසැම්බර් සිට ක්‍රියාත්මක කර ඇත. වාර්තාවේ සඳහන් එම අවශ්‍යතාවය 2023 සිට ලබා ගත හැක. | අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා වාරික එකතු කිරීම සහ හිමිකම් සැකසීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් සහතික කිරීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබා ගැනීම දුෂ්කර ය. තවද, මණ්ඩලය විසින් අග්‍රහාර ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලියට මෑත කාලීන වර්ධනයන් කිහිපයක් හඳුන්වා දී තිබුණි. කෙසේ වෙතත්, මෙහි සාර්ථකත්වය සඳහා මණ්ඩලයේ සහ සම්බන්ධිත ආයතනවල කළමනාකාරිත්වයේ සැලකිය යුතු කාලයක්, සම්පත් සහ කැපවීම් අවශ්‍ය වේ. | | |
| (ඉ.) | හිඟ ප්‍රතිරක්ශණ හිමිකම් පිළිබඳ මූල්‍ය තොරතුරු රු. 3,283,936,585 සහ ගෙවා ඇති ප්‍රතිරක්‍ෂණ හිමිකම් රු. 1,153,035,170 පැතුරුම් පත්‍රවල අතින් නඩත්තු කර ඇත. එබැවින් ප්‍රතිරක්‍ෂණ අංශයේ ගනුදෙනු හැසිරවීමට හා වාර්තා තබා ගැනීමට නිසි ක්‍රමවේදයක් නොතිබූ බව නිරීක්ෂණය වේ. මෙම ප්‍රතිරක්‍ෂණ අංශයේ මූල්‍ය තොරතුරු වාර්තා කිරීමේ දුර්වලතාවය හේතුවෙන් දත්තවල විශ්වාසනීයත්වය පිළිබඳ වැඩි අවදානමක් නිර්මාණය කරයි. තවද, ප්‍රතිරක්‍ෂණ හිමිකම් එකතු කිරීම සහ එම තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳ කාලෝචිත ක්‍රියාමාර්ග සැක සහිතය. | පද්ධතියක් නොමැති වුවද, දත්තවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සහතික කිරීම සඳහා සාමාන්‍ය පාලනයන් ඇත. හිමිකම් ක්‍රියාවලි සඳහා ගිණුම්කරණ පද්ධතියෙහි ගෙවිය යුතු ගිණුම් මොඩියුලය දැනට ක්‍රියාත්මක වේ. තවද, 2023-2027 ආයතනික සැලැස්මට අනුව ප්‍රතිරක්ශණ අංශයේ හිමිකම් හැසිරවීම සඳහා ක්‍රමවේදයක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය මේ වන විට සිදු කරමින් පවතී. | ඵලදායී වාර්තාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වන බවට කළමනාකාරිත්වය සහතික විය යුතුය. |
| (ඊ.) | විගණනය මගින් අවස්ථා ගණනාවකදී විමසීම් සිදු කර ඇතත්, ආයතනය විසින් පිළිගත හැකි ආකාරයෙන් මාණ්ඩලික ණය ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ වෙනුවට, පැතුරුම්පත් ගොනුවක කාර්ය මණ්ඩල ණය ලේඛනයක් සකස් කර ඇති අතර, අනවසර වෙනස්කම් සිදුකල හැකි වීම, අතීත තොරතුරු මකා දැමීමට ඇති හැකියාව සහ අතීත තොරතුරු මකා දැමීම් හා වෙනස් කිරීම් පිළිබඳ වාර්තා වූ සිද්ධීන් සහ අතීත තොරතුරු වල නිවැරදි බව තහවුරු කළ නොහැකි වීම හේතුවෙන් දත්ත | 2021 වර්ෂයේ විගණන නිර්දේශයෙන් පසුව, එක්සෙල් ගොනුවට අමතරව තොරතුරු වල නිරවද්‍යතාවය සඳහා ලේඛනයක් භෞතිකව වෙනම පවත්වාගෙන යනු ලැබේ. | කාර්ය මණ්ඩල ණය ලේඛනය අතින් හෝ විද්‍යුත් වශයෙන් පිළිගත හැකි ආකාරයෙන් පවත්වාගෙන යාමට කළමනාකාරීත්ය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| වල විශ්වාසනීයත්වය පහළ මට්ටමක පැවතුණි. මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2022 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල ණය මුළු ශේෂය රු. 49,815,840 කි. | | |
| (උ.) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය මගින් හඳුන්වා දුන් රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි (SOEs) මාර්ගෝපදේශ 2.3 අනුව, සියලුම රාජ්‍ය ව්‍යවසායන් සියලුම ප්‍රධාන මෙහෙයුම් ආවරණය වන පරිදි සිය පද්ධති, ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටීන් පැහැදිලිව අර්ථ දක්වා වරින් වර සමාලෝචනය කර යාවත්කාලීන කර තිබිය යුතුය. නමුත්, මණ්ඩලය සඳහා අනුමත තොරතුරු තාක්ෂණ සහ තොරතුරු පද්ධති ප්‍රතිපත්තියක් නොතිබුණි. එමනිසා, තොරතුරු තාක්ෂණ ආරක්ෂණ ප්‍රතිපත්තියක්, වාර්තා කළමනාකරණ ප්‍රතිපත්තියක්, ව්‍යාපාර අඛණ්ඩ කළමනාකරණය සහ ආපදා ප්‍රතිසාධන සැලැස්ම, කඩකිරීම් ප්‍රතිචාර සැලැස්ම සහ රහස්‍යතා ප්‍රතිපත්තියක් මණ්ඩලය සඳහා නොතිබුණි. එබැවින්, මෙය දත්ත සහ සැකසූ තොරතුරු වල වලංගුභාවය, සම්පූර්ණත්වය, අඛණ්ඩතාව, ආරක්ෂාව සහ ලබා ගැනීමේ හැකියාව කෙරෙහි බලපානු ඇත. | මාර්ගෝපදේශය අනුව තොරතුරු තාක්ෂණ හා තොරතුරු පද්ධති ප්‍රතිපත්තිය සකස් කෙරේ. | අනුමත තොරතුරු තාක්ෂණ සහ තොරතුරු පද්ධති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ.) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 07 – මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**<br>(i.) ප්‍රමිතියේ 06 වැනි ඡේදයට අනුව, මෙහෙයුම් ක්‍රියාකාරකම් යනු ආයතනයේ ප්‍රධාන ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සහ ආයෝජන හෝ මූල්‍ය කටයුතු නොවන වෙනත් ක්‍රියාකාරකම් වේ. කෙසේ | මෙම ගැලපීම් බදු වලට පෙර ලාභයෙන් බැහැර කිරීමක් නොවන බව සැලකිල්ලට ගත යුතුය. මෙම සාධාරණ වටිනාකම් | කළමනාකරණ ය විසින් ගිණුම් ප්‍රමිතියට අනුව අවශ්‍ය මුදල් ප්‍රවාහ හෙළිදරව් |

| | | |
|---|---|---|
| වෙතත්, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයට ගලපන ලද (වෙනත් විස්තීර්ණ ආදායම්) බද්දට පෙර ලාභයට කිසිදු බලපෑමක් නොකළ, ශුද්ධ අවාසිදායක සාධාරණ වටිනාකම් රු. 2,796,453,741 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහයන් යටතේ ගැලපීම් කර තිබුණි.. | ලාභය සහ පෙර වසර ගැලපීම් වෙනත් විස්තීර්ණ අයිතම වලින් පැමිණේ, ඒවා බදු ගෙවීමට පෙර ලාභයේ කොටසක් නොවන අතර අනෙකුත් මෙහෙයුම් මුදල් ප්‍රවාහයන් ලබා ගැනීමේදී ඇතුළත් කිරීමට අවශ්‍ය වේ. වෙනත් වචන වලින් කිවහොත්, බදු වලට පෙර ලාභයට මෙම ගැලපීම් ඇතුළත් නොවන නිසා එය ගැලපීම් කරන ලදී. | කිරීම් කළ යුතුය. |
| (ii.) ප්‍රමිතියේ 20 වැනි ඡේදයට අනුව, ක්ෂයවීම්, ප්‍රතිපාදන සහ උපලබ්දි නොවූ විදේශ මුදල් ලාභ හා අලාභ වැනි මුදල් නොවන අයිතමවල ප්‍රතිඵල සඳහා ලාභ හෝ අලාභ ගැලපීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය තීරණය කරනු ලබයි. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ ගණනය කිරීමේදී උපලබ්දි නොවූ විනිමය ලාභය රු. 1,340,224,161 ක් ගැලපීම් කර නොතිබුණි. | මණ්ඩලය නිරීක්ෂණ සමග එකඟ වේ. පාරිතෝෂිකය සහ උපලබ්දි නොවූ විනිමය ලාභ ඒ අනුව ගැලපීම් කරනු ලැබේ. | |
| (iii.) විගණන ගණනය කිරීම අනුව, මෙහෙයුම් වගකීම්වල වෙනස්වීම් යටතේ අනෙකුත් වගකීම්වල වැඩිවීම/(අඩුවීම) රු. 779,228,773 ක වැඩිවීමකි. කෙසේ වෙතත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව අනෙකුත් වගකීම්වල වැඩිවීම/(අඩුවීම) රු. 15,634,934 ක වැඩිවීමකි. එබැවින් රු. 763,593,839 ක වෙනසක් නිරීක්ෂණය විය. වසර සඳහා ගෙවිය යුතු ආදායම් බදු වැඩි වීම රු. 716,489,107 පිළිබඳව මණ්ඩලය සැලකිල්ලට නොගැනීම හේතුවෙන් මෙම වෙනස ඇති විය. | මණ්ඩලය නිරීක්ෂණය සමග එකඟ වේ. | |
| **(ආ.) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 24 – සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් කිරීම** | | |
| (i.) ප්‍රමිතියේ 3 වැනි ඡේදයට අනුව සම්බන්ධිත **පාර්ශව** සබඳතා, ගනුදෙනු සහ බැඳීම් ඇතුළුව හිඟ ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, සම්බන්ධිත **පාර්ශව** සහ එම සම්බන්ධිත **පාර්ශව** සමඟ ගනුදෙනු හඳුනා ගැනීමට | PED චක්‍රලේඛ අංක 3/2015 අනුව අධ්‍යක්ෂවරුන්ට සහ සභාපතිවරුන්ට සියලුම දීමනා ගෙවනු ලබන අතර | කළමනාකාරිත්වය විසින් ප්‍රමිතියට අනුව අවශ්‍ය අදාළ සම්බන්ධිත |

අභ්‍යන්තර පාලන පද්ධතියක් මණ්ඩලයට නොමැති බව නිරීක්ෂණය විය.

(ii.) තවද, ප්‍රමිතියේ 13 වැනි ඡේදයට අනුකූලව අදාළ පාර්ශවයන් සමඟ ඇති සබඳතා සහ ඔවුන් සමඟ කරන ලද ගනුදෙනු සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ හඳුනාගත් අදාළ පාර්ශවයන් සහ එම සම්බන්ධ පාර්ශවයන් සමඟ සිදු කළ ගනුදෙනු කිහිපයක් පහත පරිදි වේ.

| සම්බන්ධිත පාර්ශවය | සම්බන්ධතාවය | ගනුදෙනුව | රු./ඇ.ඩො. |
|---|---|---|---|
| ආසියානු ප්‍රතිරක්ෂණ සංස්ථාව | සාමාජික රට සහ සභා නියෝජිත | ආයෝජනය | ඇ.ඩො. 980,000 |
| | | ගෙවූ ප්‍රතිරක්ෂණ වාරික | රු. 28,383,473 |
| මවාහිබ් මච්ජූඩ් මයා (05.02.2020 20.05.2023) | සභාපති | කෙටි කාලීන සේවක ප්‍රතිලාභ | රු. 2,692,735 |
| මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින් | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | | |

ඔවුන්ගේ දීමනා වැඩි කිරීමට බලපෑම් කිරීමට එම අධ්‍යක්ෂවරුන්ට කිසිදු හැකියාවක් නොමැත. භාණ්ඩාගාර දායකත්වය සහ ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලද මුදල් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල රේඛීය අයිතම ලෙස පැහැදිලිවම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇත. එබැවින් මෙම තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන්වල පැහැදිලිව අනාවරණය කර ඇත. ශ්‍රී.ල.ගි.ප්‍ර. 24 හි 11 ඡේදයට අනුව අධ්‍යක්ෂවරුන් සහ රේඛීය අමාත්‍යාංශය සම්බන්ධිත පාර්ශවයන් ලෙස නොසැලකේ. (a) සහ c (iv) උපවගන්තිය බලන්න. වාර්තාකරණ ආයතනය පාලනය නොකරන, ඒකාබද්ධව පාලනය නොකරන හෝ සැලකිය යුතු බලපෑමක් නොකරන රජයේ දෙපාර්තමේන්තු සහ ආයතන, හුදෙක් ආයතනයක් සමඟ ඔවුන්ගේ සාමාන්‍ය ගනුදෙනු (ඒවා ආයතනයක ක්‍රියාකාරීත්වයේ නිදහසට බලපෑ හැකි වුවද) හෝ එහි තීරණ ගැනීමට සහභාගී වේ.

පාර්ශව හෙළිදරව් කිරීම් කළ යුතුය.

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මත ලැබිය යුතු පොලිය සඳහා රු. 138,603,776ක් හානිකරන අලාභ සඳහා වෙන්කර තිබුනි. නමුත් , මණ්ඩලය විසින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මත හානිකරන අලාභ වෙන් කිරීම සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රතිපත්ති අංක: 19 යටතේ, මූල්‍ය ආයෝජන, කල් පිරෙන තෙක් මූල්‍ය උපකරණ කාණ්ඩය යටතේ සාරාංශගත වගුවක ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර පැහැදිලිව වර්ගීකරණය කර අනාවරණය කර ඇත. | **මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මත හානිකරන අලාභ හඳුනා ගැනීම සහ මැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළි කිරීමට කළමනාකාරීත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.** |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 අප්‍රේල් 18 වැනි දින විගණන දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයේ අමුණා ඇති මුදල් පොතේ ශේෂය සහ පරිගණක පද්ධතියට අනුව මුදල් පොතේ ශේෂය අතර මාස එකොළහකට (11) අදාළව එක් බැංකු ගිණුමක රු. 9,770,983 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම නිරීක්ෂණයට ප්‍රතිචාර දැක්වීමට මණ්ඩලයට වඩාත් සවිස්තරාත්මක තොරතුරු අවශ්‍ය වේ. | **කළමනාකාරීත්වය විසින් බැංකු ශේෂවල වෙනස්කම් කාලීන ලෙස හඳුනාගෙන එම වෙනස්කම් නිවැරදි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.** |

### 1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1989 සැප්තැම්බර් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 1989/107(85) සහ 2008 මාර්තු 25 දිනැති අංක 1542/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 3(1) ඡේදය අනුව ප්‍රාථමික රක්ෂණ සමාගම් විසින් රක්ෂණ ඔප්පු නිකුත් කිරීමෙන් වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී (SRCC සහ Tr) ආවරණය සඳහා ලබාගන්නා වාරික වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී (SRCC සහ Tr) අරමුදලට බැර කළ යුතුය. කෙසේ වෙතත්, මණ්ඩලය එම රක්ෂණ වාරිකවලින් එකතු කර ගෙන ඇත්තේ මෝටර් රථ රක්ෂණයෙන් සියයට | මණ්ඩලය ආරම්භයේ සිටම මෝටර් පංතිය සඳහා ක්‍රියාත්මක කරන ලද Motor XOL විධිවිධානයට අනුව සහ මණ්ඩලය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.. ඒ අනුව, මෝටර් පන්තියේ අමතර පාඩු විධිවිධානය (XOL) යටතේ අය කරන වාරිකයේ ප්‍රතිශතය කලින් කල තීරණය කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක | මණ්ඩලය අදාළ නීතිමය විධිවිධානවලට අනුකූලව රක්ෂණ සමාගම්වලින් වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී (SRCC සහ Tr) ආවරණ වාරික එකතු කළ යුතුය. |

12 ක් සහ මෝටර් නොවන රක්ෂණයෙන් සියයට 80 ක් පමණි. එබැවින්, වර්ෂය සඳහා දළ ලිඛිත වාරිකය රු. 12,369,745,744 කින් අවතක්සේරු වී ඇත. 2005 දී මෙම අරමුදල මණ්ඩලයට භාර දෙන විට වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී (SRCC සහ Tr) අරමුදල රුපියල් බිලියන 10.9 කි. 2022 වසරේදී අරමුදල රුපියල් බිලියන 17.8 කි. මෙම අරමුදලට එකතු වන සියලුම අරමුදල් එම නීතිමය ප්‍රතිපාදනවල සඳහන් ප්‍රතිපාදන අනුව ලැබුණේ නම් මෙම අරමුදල රුපියල් බිලියන 68.9ක් විය යුතුව තිබුණි. ඒ අනුව පසුගිය වසර 17 තුළ අරමුදලට සිදු වූ පාඩුව දළ වශයෙන් රුපියල් බිලියන 51 කි. පසුගිය වසර 17 තුළ අරමුදලට අදාළ සියලුම අරමුදල් ලැබුණේ නම්, අරමුදලේ සඵල වර්ධනය සියයට 11.5 ක් විය යුතුය. කෙසේ වෙතත්, අරමුදලේ වත්මන් ඵලදායී වර්ධනය සියයට 3ක් පමණක් බව නිරීක්ෂණය විය. මණ්ඩලයේ කළමනාකාරිත්වයට අනුව 2006 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශය විසින් අරමුදලේ පරිපාලනය මණ්ඩලය වෙත පැවරීමේදීද මෙම ක්‍රමය ක්‍රියාත්මක වී ඇත. තවද, 2023 මැයි 11 සහ 2023 ඔක්තෝම්බර් 03 යන දෙදින තුළ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී (COPE) මෙම කරුණ සාකච්ඡා වූ අතර අමාත්‍ය මණ්ඩලයේ තීරණය නොසලකා හැරීමෙන් සිදු වූ මූලික වරදක් බව කෝප් කමිටුවේ අදහස විය. කෙසේ වෙතත්, මෙම ගැටළුව විසඳීම සඳහා ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. තවද, 2006 වර්ෂයේදී මෙම අරමුදල මණ්ඩලයට පැවරීමේදී මෙම අරමුදලේ කළමනාකාරිත්වයට අදාළ ලියකියවිලි මුදල් අමාත්‍යාංශය විසින් මණ්ඩලය වෙත භාරදී නොතිබුණි. එබැවින් මෙම මූලික දෝෂය සිදුවූ කාලසීමාව සහ මේ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයින් සොයා ගැනීම අපහසු විය.

53-16 අනුව වාරික වශයෙන් ලබාගත් මුදල රක්ෂණ සමාගම් විසින් එකතු කරන ලද මුළු වාරිකයෙන් 12% කි. කෙසේ වෙතත්, 12% තීරණය කිරීමට පෙර, එම වසරේම මුළු වාරිකයෙන් 15% ක් ඉල්ලා සිටියද, කර්මාන්තය එම තීරණයට විරුද්ධ වීම නිසා අවසානයේ එය 12% දක්වා අඩු කරන ලදී.

2021 දී මණ්ඩලයේ කළමනාකාරීත්වය ලෙස XOL සැකැස්මේ වර්තමාන භාවිතය නතර කිරීමට අවස්ථාව බව සටහන් කරගන්නා ලදී. එබැවින් අංක 172-03 දරන මණ්ඩල පත්‍රිකාවට අනුව 2022 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 100% වාරික සහිතව මෝටර් රථ රක්ෂණ පන්තියේ දැනට පවතින මෝටර් වාරික එකතු කිරීමේ ක්‍රමය වෙනස් කර 100%ක් භාර ගැනීමට තීරණය කරන ලදී. එය ක්‍රියාත්මක කිරීමට කර්මාන්තය විරුද්ධ වූ බැවින් එය කල් දමන ලදී. මණ්ඩල තීරණ අංක 189-1 අනුව, මෝටර් රථ ප්‍රතිපත්ති සඳහා 100% වාරිකය 2023 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන අතර, 2023 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රියාත්මක වන දිනය වෙනස් කරන ලෙස කර්මාන්තය නැවත ලිපියක් මගින් ඉල්ලා ඇත.

### 1.5.6 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ.) ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ සඳහා හිමිකම් ප්‍රතිපාදන | 3,257,556,048 | 3,084,608,000 | 172,948,048 | ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ හිමිකම් සඳහා තෙවන පාර්ශව තහවුරු කිරීම් ලබා ගැනීමට මණ්ඩලය දැනටමත් ඊමේල් යවා ඇත. කෙසේ වෙතත්, අපේක්ෂිත සියලුම තහවුරු කිරීම් ලැබෙමින් පවතින අතර මණ්ඩලය එම තහවුරු කිරීම් ලබා ගත් වහාම ඒවා විගණනය වෙත යොමු කරනු ලැබේ. | වෙනස්කම් හඳුනා ගැනීමට සහ ඒවා නිවැරදි කිරීමට කළමනාකරණය විසින් ඔවුන්ගේ මූල්‍ය වාර්තා වෙනත් අදාළ අනුරූප වාර්තා සමඟ කාලෝචිත ලෙස සංසන්දනය කළ යුතුය. |
| (ආ.) ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වාරික සහ වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී (SRCC සහ Tr) ලැබිය යුතු වාරික මුදල් | 4,988,247,662 | 5,665,899,000 | 677,651,338 | ප්‍රතිරක්ෂණ වාරික ලැබිය යුතු මුදල් සඳහා තෙවන පාර්ශවීය තහවුරු කිරීම් ලබා ගැනීමට මණ්ඩලය දැනටමත් ඊමේල් යවා ඇත. කෙසේ වෙතත්, අපේක්ෂිත සියලුම තහවුරු කිරීම් ලැබෙමින් පවතින අතර මණ්ඩලය එම තහවුරු කිරීම් ලබා ගත් වහාම ඒවා විගණනය වෙත යොමු කරනු ලැබේ. කෙසේ වෙතත්, විගණන නිලධාරීන් විසින් කලින් සිදු කරන ලද පරිදි සත්‍යාපනය සඳහා විකල්ප ක්‍රියා පටිපාටිය සිදු කළ හැක. | |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ.) ලැබිය යුතු අධිභාර බදු | 1,196,274,044 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ ලිඛිත සන්නිවේදන හෝ තහවුරු කිරීම | මණ්ඩලය නිරීක්ෂණ සමග එකඟ වේ. | ඵලදායී විගණනයක් ක්‍රියාත්මක කිරීම සඳහා කලමනාකාරීත්වය විසින් තොරතුරු |

| | | | | |
|---|---|---|---|---|
| (ආ.) ලැබිය යුතු ආදායම් බදු | 22,465,243 | බදු ගණනය කිරීම සහ තහවුරු කිරීම් | මණ්ඩලය දැනටමත් අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත. | නියමිත වේලාවට ලබා දීම සහතික කළ යුතුය |
| (ඇ.) ලැබිය යුතු කුලී තැන්පතු | 2,180,969 | ගෙවීම් වවුචරය සහ ගිවිසුම | මණ්ඩලය මෙම නිරීක්ෂණය සඳහා අවශ්‍ය තොරතුරු සපයනු ඇත. | |
| (ඈ.) දිගුකාලීන හිඟ ගෙවිය යුතු ශේෂයන් | 785,493,566 | **ඉන්වොයිස්, ගිවිසුම්** | මෙම නිරීක්ෂණයට ප්‍රතිචාර දැක්වීමට මණ්ඩලයට වඩාත් සවිස්තරාත්මක තොරතුරු අවශ්‍ය වේ. | |
| (ඉ.) ගෙවීම් වවුචරය | 2,139,623 | උපකාරක ලියකියවිලි සමඟ ගෙවීම් වවුචර දහතුනක් (13). | මෙම නිරීක්ෂණයට ප්‍රතිචාර දැක්වීමට මණ්ඩලයට වඩාත් සවිස්තරාත්මක තොරතුරු අවශ්‍ය වේ. | |

## 1.6 ලැබිය යුතු ගිණුම්

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ.) වසර එකකට වැඩි කාලයක් හිඟව පවතින ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වාරික රු. 267,629,300 ක් වන අතර එය ලැබිය යුතු මුළු ප්‍රතිරක්ෂණ වාරිකයෙන් 15% ක් නියෝජනය කරන අතර වසර දෙකකට වැඩි කාලයක් හිඟව පවතින ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වාරික රු. 147,908,237 ක් වන අතර එය ලැබිය යුතු මුළු ප්‍රතිරක්ෂණ වාරිකයෙන් 8% ක් නියෝජනය කරයි. වසර තුනකට වැඩි කාලයක් හිඟව පවතින ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වාරික රු. 689,634,512 ක් වන අතර එය ලැබිය යුතු මුළු ප්‍රතිරක්ෂණ වාරිකයෙන් 39% ක් නියෝජනය කරයි. ඒ අනුව, ආයතනය දිගුකාලීනව හිඟව පවතින ප්‍රතිරක්ෂණ ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | මණ්ඩලය මාසිකව රක්ෂණ සමාගම් වෙත සිහිකැඳවීම යවනු ලබයි. හිමිකම් නිරවුල් කරන අවස්ථාවේදී, මෙම ලැබිය යුතු මුදල් කපා හැරීමට හැකියාව ඇත, එබැවින් අනාගතයේදී මෙම ශේෂයන් අයකර ගනු ඇත.. | මණ්ඩලය විසින් හිඟ ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | |
|---|---|
| (ආ.) ප්‍රතිරක්‍ෂණ වාරික ලැබිය යුතු මුදල් රු.මි. 1,105 ක්, ප්‍රාථමික රක්‍ෂණ SRCC (මෝටර් නොවන) ලැබිය යුතු මුදල රු.මි. 49, ප්‍රාථමික රක්ෂණය SRCC (මෝටර්) ලැබිය යුතු මුදල රු.මි. 28 ක් සහ සාමාන්‍ය රක්ෂණ (මෝටර් නොවන) ලැබිය යුතු මුදල රු.මි. 18 ක් 2022 දෙසැම්බර් 31 දිනට වසර 1 සිට 3 දක්වා කාලයක් හිඟ විය. කෙසේ වෙතත්, එම දිගුකාලීන ලැබිය යුතු ශේෂයන් එකතු කර ගැනීමට මණ්ඩලය ඵලදායී පියවර ගෙන නොතිබුණි. | මණ්ඩලය මාසිකව රක්ෂණ සමාගම් වෙත සිහිකැඳවීම යවනු ලබයි. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ.) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 13(ඉ) වගන්තිය | පනතේ විධිවිධානවලට අනුව අරමුදල සම්බන්ධයෙන් සාමාන්‍ය ගිණුමක් සහ එක් එක් සාමාජිකයා සම්බන්ධයෙන් වෙන වෙනම තනි ගිණුම් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, අරමුදල විසින් තනි සාමාජිකයින් සඳහා වෙනම ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබුණි. | තනි පුද්ගල ගිණුම් විස්තර තොරතුරු පද්ධතිය තුළ පවත්වාගෙන යනු ලැබේ; සේවාලාභීන්ගේ ජාතික හැඳුනුම් හැඳුනුම්පත් අංක භාවිතයෙන් ඒවාට ප්‍රවේශ විය හැක. | **මණ්ඩලය පනතේ අදාළ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය.** |
| (ආ.) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 23 වැනි වගන්තිය | පනතේ විධිවිධානවලට අනුකූලව, රක්ෂණ සමාගම් විසින් මණ්ඩලයට උපචිත මුදල නිවැරදිව ඉන්වොයිස් කර ප්‍රේෂණය කර තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා රක්ෂණ සමාගම්වල වාර්තා පරීක්ෂා කිරීමට මණ්ඩලයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මණ්ඩලයට නිරීක්ෂණයට එකඟ විය. සාමාන්‍යයෙන්, අභ්‍යන්තර විගණන අංශය රක්ෂණ සමාගම්වල ආදායම් සත්‍යාපනය සිදු කරයි. කෙසේ වෙතත්, කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන්, මෙම සත්‍යාපනය සතුටුදායක ලෙස ක්‍රියාත්මක නොවීය. කෙසේ වෙතත්, අතිරේක කාර්ය මණ්ඩලයක් සමඟ අභ්‍යන්තර විගණන | මණ්ඩලය පනතේ අදාළ විධිවිධානවලට අනුකූල විය යුතු අතර සම්පූර්ණ හා කාලෝචිත ලෙස ආදායම් එකතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අංශය ශක්තිමත් කිරීමෙන් පසුව, මෙම සත්‍යාපනය ඵලදායී ලෙස සිදු කෙරේ. | |
| (ඇ.) මු. රෙ. 261(1) | ගෙවීම් වවුචරවල අනුක්‍රමික අංක අනුපිළිවෙල නිසි ලෙස නඩත්තු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ විය. කෙසේ වෙතත්, මෙම අනු පිළිවෙල ආයෝජන සහ අරමුදල් මාරු කිරීමේ ගනුදෙනු සඳහා යොදාගෙන නොමැත. එම ආකාරයේ ගනුදෙනු සඳහා, වෙනම අනුපිළිවෙලක් පවත්වාගෙන යනු ලැබේ. | කළමනාකරණය මූල්‍ය රෙගුලාසිවල අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |
| (ඈ.) මු. රෙ. 386(7) | අවලංගු කරන ලද චෙක්පත්, චෙක් පිලිපතේ අමුණා තිබිය යුතු වුවද, මණ්ඩලය විසින් ගෙවීම් වවුචරය සමඟ අවලංගු කරන ලද චෙක්පත් අමුණා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වවුචරය අස්ථානගත වීමකදී අවලංගු කරන ලද චෙක්පත් සම්බන්ධ සියලු තොරතුරුද නැතිවී යා හැක. | මණ්ඩලය නිරීක්ෂණය සමග එකඟ වේ. | මූල්‍ය තොරතුරු සුරක්ෂිත කිරීම සඳහා කළමනාකරණය මූල්‍ය රෙගුලාසිවල අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |
| (ඉ.) මු.රෙ.446 (1)(c) | වර්ජන කැරලි කෝලාහල සිවිල් කලබල සහ ත්‍රස්තවාදී අරමුදලෙහි (SRCC සහ Tr) අරමුදල් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් බැංකු ගිණුම් තුනකට (03) අදාළව මුදල් පොත් මේ දක්වා ලියා නොතිබූ අතර දෛනික හෝ මාසික පදනමින් එකතුකර තුලනය කර නොතිබූ අතර වගකිවයුතු අධීක්ෂණ හෝ මාණ්ඩලික නිලධාරියකු විසින් මුදල් පොතට අත්සන් කර නොමැත. | මණ්ඩලය නිරීක්ෂණය සමග එකඟ වේ. කෙසේ වෙතත්, වර්තමානයේ මෙය නිවැරදිව අඛණ්ඩව සිදුකරමින් පවතී. | කළමනාකරණය මූල්‍ය රෙගුලාසිවල අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |
| (ඊ.) 2022 ජනවාරි 18 දිනැති අංක PED 2/2022 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 04 | චක්‍රලේඛයේ විධිවිධාන අනුව ජංගම දුරකථන මිලදී ගැනීමේ පිරිවැය නිලධාරීන් විසින් පුද්ගලිකව දරා ගත යුතුය. කෙසේ වෙතත්, | ව්‍යාපාරික අවශ්‍යතා සපුරාලීම සඳහා මණ්ඩලයට නිල කාර්යයන් සඳහා සේවකයින්ට ජංගම දුරකථන මිලදී ගැනීමට සිදුවේ. ඊට අමතරව ඒවා | **කළමනාකාරිත්වය චක්‍රලේඛයේ අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.** |

| | | | |
|---|---|---|---|
| වගන්තිය | මණ්ඩලය රු. 220,000 ක් වියදම් කර සේවකයින් සඳහා 2022 වසර සඳහා ජංගම දුරකථන මිලදී ගෙන තිබුණ අතර රු. 12,200 ක් ගෙවා ජංගම දුරකථන අලුත්වැඩියා කර ඇත. මේ ආකාරයට ජංගම දුරකථන මිලදී ගැනීම සඳහා මණ්ඩලය විසින් 2016 සිට 2022 දක්වා රු. 2,821,071 ක පිරිවැයක් දරා තිබුණි. | මණ්ඩලයේ වත්කම් ලෙස සටහන් කර (ඉන්වෙන්ටරියට ගෙන) භාවිතය සඳහා කාර්ය මණ්ඩලයට වෙන් කර ඇති අතර රැකියාවෙන් ඉල්ලා අස් වූ විට හෝ කාලසීමාව අවසානයේ වෙන් කළ ජංගම දුරකථනය මණ්ඩලය වෙත ආපසු ලබා දිය යුතුය. එබැවින් මෙය චක්‍රලේඛයේ දක්වා ඇති පුද්ගලික ජංගම දුරකථන ප්‍රතිපූරණයක් නොවේ. ඒ අනුව අවශ්‍යතා අනුව කාර්ය මණ්ඩලයට ලැප්ටොප්, ජංගම දුරකථන, ටැබ් ලබාදිය හැක. | |
| (උ.) 2021 රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.2.2 (b) (xii) මාර්ගෝපදේශය | මාර්ගෝපදේශය අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු පත් කිරීම සහ ඒවායේ නිසි ක්‍රියාකාරිත්වය සහතික කළ යුතුය. කෙසේ වෙතත්, අවදානම් කමිටුව, සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව වැනි අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක වී නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. පැවති වසංගත තත්ත්වය නිසා මෙය ප්‍රායෝගික නොවීය. තවද සමාලෝචනය කිරීමට නියමිත කාල සීමාව තුළ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු කිසිවක් සිදු නොවීය. | **කළමනාකාරීත්වය ආයතනික යහපාලනයේ අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.** |
| (ඌ.) 2017 සංයුක්ත මනා පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ G.2 මූලධර්මය | මණ්ඩලය විසින් ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියෙකු (CISO) පත් කර නොතිබීම හෝ ආයතනය සඳහා සයිබර් ආරක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සකස් කර නොතිබුණි. | වර්තමානයේ 2017 සංයුක්ත මනා පාලනය පිළිබඳ මාර්ගෝපදේශය ලැයිස්තුගත කර ඇති සමාගම් සහ අනෙකුත් විශාල සමාගම් විසින් බහුලව භාවිතා කරනු ලබයි. මණ්ඩලය දැනට තොරතුරු තාක්ෂණ කළමනාකරුවකු පත් කර ඇත. | **කළමනාකාරීත්වය යහපාලන අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.** |

## 1.8 ආයෝජන ක්‍රියාකාරකම්

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ.) රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි | 2022 දෙසැම්බර් 27 වැනි දින ආයෝජන කමිටුව පත් කරන ලදී. කෙසේ වෙතත්, | දූරදර්ශී ආයෝජන තීරණ සහතික කිරීම සඳහා |

| | | |
|---|---|---|
| මාර්ගෝපදේශ 6.2 (iii.) අනුව, ආයෝජන කමිටුව සෑම මසකම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතු අතර, එහිදී ගත් තීරණ සඳහා එකඟතාව සහ අවසර දී ඇති සීමාවෙන් ඔබ්බට ආයෝජන නිර්දේශ ඉදිරියට ගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය. අරමුදලේ ආයෝජන ප්‍රතිපත්ති කෙටුම්පතේ 17 වැනි ඡේදයට අනුව ආයෝජන කමිටුව කාලීනව රැස්විය යුතු අතර ආයෝජන කමිටුවේ වගකීම් නිර්වචනය කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා ආයෝජන කමිටුව රැස්වී නොතිබුණි. | ආයෝජන කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ඉල්ලා අස්වීම හේතුවෙන් කමිටුව නැවත පත්කිරීමට සිදු විය. එබැවින් ආයෝජන කමිටු රැස්වීම 2023 මාර්තු මාසයේ නියමිත පරිදි පැවැත්වුණේ නැත. නව කමිටු සාමාජිකයා පත් කිරීමත් සමඟ, මණ්ඩලය විසින් 04/07/2023 දින ආයෝජන කටයුතු සමාලෝචනය කිරීම සඳහා ආයෝජන කමිටු රැස්වීමක් සංවිධානය කරනු ඇත. කෙසේ වෙතත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසායන් සඳහා නිකුත් කරන ලද මෙහෙයුම් අත් පොත අනුව මෙම අවශ්‍යතාවයට අනුගත විය යුත්තේ පසුගිය වසර දෙක තුළ රුපියල් බිලියන 30 කට වැඩි ස්ථාවර ආදායමක් ලබා ඇති රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසායන් වේ. එබැවින්, මෙම කොටස යටතේ මණ්ඩලය සඳහා එවැනි අවශ්‍යතාවයක් නොමැත. | ආයෝජන කමිටුවේ ඵලදායී ක්‍රියාකාරිත්වය මණ්ඩලය විසින් සහතික කළ යුතුය. |
| (ආ.) ආයෝජන ප්‍රතිපත්තිය අවම වශයෙන් වාර්ෂිකව නිතිපතා සමාලෝචනය කිරීමට ප්‍රතිපාදන ඇතුළත් කර නොමැත. සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් ආයෝජන ප්‍රතිපත්තිය සමාලෝචනය කර ඇත. කෙසේ වෙතත්, **2023** මැයි **31** වන විටත් ආයෝජන ප්‍රතිපත්තිය සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් ඇතුළත් කර නොතිබුණි. | පවතින ආයෝජන ප්‍රතිපත්තිය සමාලෝචනය කර යාවත්කාලීන කරන ලදී. එය තවදුරටත් සමාලෝචනය කිරීම සඳහා ආයෝජන කමිටුවට ඉදිරිපත් කරනු ඇත. | මණ්ඩලය විසින් අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි නිතිපතා සමාලෝචනය කළ යුතුය. |
| (ඇ.) ආයෝජන ප්‍රතිපත්තියට අනුව, ආයෝජන තෝරා ගැනීම ආර්ථික තත්ත්වයන්, පොලී අනුපාත හැසිරීම්, අනාගත ප්‍රවණතා සහ මණ්ඩලයේ මෙහෙයුම් මුදල් ප්‍රවාහ අවශ්‍යතා මත පදනම් වන බව සඳහන්වේ. කෙසේ වෙතත්, දූරදර්ශී ලෙස ආයෝජන තීරණ ගැනීම සඳහා අතිරික්ත මුදල් ප්‍රවාහයන් සහ එම මුදල් ප්‍රවාහයන් ඇතිවන | මුදල් ප්‍රවාහයන් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා සකස් කර නැත. මණ්ඩලයේ ව්‍යාපාරයේ ස්වභාවය අනුව, ද්‍රවශීලතා අවශ්‍යතාවය සහ අරමුදල් තත්ත්වය පිළිබඳව ආයෝජන තීරණයක් ගැනීමට පෙර දිනපතා කාලයේ සහ වටිනාකම පිළිබඳව නිරීක්ෂණය කරනු ලැබේ. එබැවින්, මුදල් ප්‍රවාහ පුරෝකතන මත නොව සත්‍ය සංඛ්‍යා මත පදනම්ව තීරණ ගනු ලැබේ. දෛනික ශේෂයන් සහ ආයෝජන වාර්තාව මත පදනම්ව දෛනික මුදල් ලබා ගැනීම සහ | ආයෝජන තීරණ දූරදර්ශී ලෙස ගැනීමට අනාගත මුදල් ප්‍රවාහයන් හා ඒවායේ කාලය හඳුනා ගැනීම සඳහා මුදල් ප්‍රවාහ පුරෝකථන සකස් කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| කාලය හඳුනා ගැනීම සඳහා මුදල් ප්‍රවාහ පුරෝකතනයන් සකස් කර නොතිබුණි.. | අතිරික්ත අරමුදල් හඳුනා ගැනේ. දෛනික ආයෝජන තීරණ ගත යුතු බැවින්, මූල්‍ය බලතල පැවරීම යටතේ, මණ්ඩලය විසින් එහි බලතල අදාළ නිලධාරීන්ට සහ ආයෝජන කමිටුවට පවරා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. . 6,049,158,366 ක බදු පසු ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 5,127,770,399 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 921,387,969 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පෙර වසරට සාපේක්ෂව ශුද්ධ ඉපැයූ වාරිකය රු. 2,305,263,773 කින් වැඩිවීම හා අනෙකුත් ආදායම් රු. 3,497,689,632 කින් වැඩිවීම මෙම වර්ධනයට හේතු වී ඇත

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| වර්ෂය | 2022<br>රු. | 2021<br>රු. | විචලනය<br>රු. | විචලනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| ශුද්ධ ඉපැයූ වාරිකය | 19,917,476,462 | 17,612,212,689 | 2,305,263,773 | 13% |
| වෙනත් ආදායම් | 5,087,817,415 | 1,590,127,783 | 3,497,689,632 | 220% |
| ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම් | (14,693,275,021) | (10,761,281,045) | (3,931,993,976) | 37% |
| ප්‍රාරක්ෂණ (Underwritting) සහ අත්පත් කර ගැනිමේ පිරිවැය | (1,996,068,323) | (1,863,920,737) | (132,147,586) | 7% |
| වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් | (560,176,052) | (388,977,070) | (171,198,982) | 44% |
| ආදායම් බදු | (1,698,105,721) | (1,047,206,674) | (650,899,047) | 62% |
| වසර සඳහා ලාභය | 6,049,158,368 | 5,127,770,399 | 921,387,969 | 18% |

### 2.3 අනුපාත විශ්ලේෂණය

විගණනයට ලබා දී ඇති මූල්‍ය ප්‍රකාශන සහ තොරතුරු අනුව, පසුගිය වසර හතර සඳහා වැදගත් අනුපාත කිහිපයක් පහත පරිදි විය.

| අනුපාතය | 2022 | 2021 | 2020 | 2019 | 2018 |
|---|---|---|---|---|---|
| රඳවා ගැනීමේ අනුපාතය | 177% | 174% | 161% | 143% | 138% |
| මුළු හිමිකම් අනුපාතය | 48% | 58% | 46% | 60% | 72% |
| වියදම් අනුපාතය | 13% | 8% | 12% | 16% | 16% |
| ඒකාබද්ධ අනුපාතය | 61% | 67% | 57% | 76% | 87% |
| ආදායම් වර්ධන අනුපාතය | 30% | 1% | 6% | 18% | 18% |
| ලාභදායිත්ව අනුපාතය | 69% | 56% | 90% | 24% | 34% |
| ශුද්ධ ලාභය | 24% | 26% | 40% | 18% | 21% |

| | | | | | |
|---|---|---|---|---|---|
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | 21% | 20% | 37% | 17% | 19% |
| හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය | 43% | 38% | 83% | 43% | 47% |
| ද්‍රවශීලතා අනුපාතය | 1.0 | 1.4 | 1.2 | 0.68 | 0.74 |
| ජංගම අනුපාතය | 8.27 | 8.78 | 6.26 | 8.92 | 9.34 |
| මුළු වත්කම්වලට මූල්‍ය වත්කම් අනුපාතය | 71% | 81% | 82% | 77% | 76% |
| වත්කම් පිරිවැටුම් අනුපාතය | 1.34 | 1.12 | 1.34 | 2.46 | 2.17 |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය සමාලෝචිත වර්ෂය සඳහා අධිභාර බද්ද ලෙස රු.1,196,274,044 ක් වර්ජන කැරලි කෝලාහල සිවිල් කලබල සහ ත්‍රස්තවාදී (SRCC) අරමුදලේ අරමුදල් වලින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත සමාන වාරික දෙකකින් 2022 වර්ෂයේදී ගෙවා තිබුණි. කෙසේ වෙතත්, 2022 අංක 14 දරන අධිභාර බදු පනතේ 06 වැනි වගන්තියට අනුව, අධිභාර බදු අවශ්‍යතාවයන් සඳහා මණ්ඩලය, සමාගමක් යන අර්ථයෙන් බැහැර කර ඇත. එබැවින් මණ්ඩලය අධිභාර බද්ද සඳහා යටත් නොවේ. එබැවින් බද්දට යටත් නොවන බදු ගෙවීම හේතුවෙන් SRCC මණ්ඩලයට රු. 1,196,274,044 ක අලාභයක් සිදු වී තිබුණි. මෙම වැරදි බදු ගෙවීම නිසා සමාලෝචිත වර්ෂයට අදාළව සියයට 23.73 ක සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතය මත පදනම්ව 2023 මැයි 31 දිනට වර්ජන කැරලි කෝලාහල සිවිල් කලබල සහ ත්‍රස්තවාදී (SRCC) අරමුදලට පොලී ආදායම අහිමි වීම රු. 274,542,926 ක් බව නිරීක්ෂණය විය. | මණ්ඩලය නිරීක්ෂණය සමග එකඟ වේ. මණ්ඩලයේ අනෙකුත් බදු වගකීම්වලට එරෙහිව හිලව් කිරීමට මණ්ඩලය වහාම පියවර ගෙන ඇත. දැනටමත් ගෙවා ඇති අධිභාර බද්ද වෙනත් බදු වගකීම් වලින් අඩු කළ හැකි වේ. කෙසේ වෙතත්, අනාගතයේදී මෙවැනි සිදුවීම් නැවත සිදු නොවීමට මණ්ඩලය වග බලා ගනු ඇත. | මණ්ඩලය විසින් බදු නීති නිසි ලෙස ඇගයීමට ලක් කළ යුතු අතර බදු ගෙවීමට පෙර ඔවුන්ගේ බදු වගකීම් හඳුනා ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ.) මණ්ඩලයේ දත්ත විශ්වාසනීය මට්ටම ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදු කිරීමට අදාළව, දත්ත ග්‍රහණය කර ගැනීම, ව්‍යාපාරයේ ප්‍රධාන කොටස් බෙදීම, හිමිකම් ගණන් සැපයීම සහ හිමිකම් හැසිරවීමේ වියදම් සම්බන්ධයෙන් ජීව ගණක විසින් 2019 වර්ෂයේ සිට නිර්දේශ කර තිබුණි. නමුත් අරමුදලේ දත්තවල විශ්වාසනීය මට්ටම වැඩි දියුණු කිරීම සඳහා ආයුගණක වාර්තාව අධ්‍යක්ෂක මණ්ඩල මට්ටමින් හෝ සුදුසු | රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශයට අවශ්‍ය පරිදි මණ්ඩලය සතුව 75% දත්ත විශ්වාසනීය මට්ටමක් ඇති බැවින්, දත්ත විශ්වාසනීය මට්ටමේ අවශ්‍යතාවය තවදුරටත් වැඩි කිරීම හෝ අඩු කිරීම අවශ්‍ය නොවේ.. මණ්ඩලය විසින් | මණ්ඩලයේ දත්ත විශ්වාසනීය මට්ටම වැඩි දියුණු කිරීම සඳහා ආයු ගණක විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කළමනාකාරීත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| කළමනාකරණ මට්ටමින් 2019 වර්ෂයේ සිට සාකච්ඡා කර නොතිබුණි. | ආයුගණක වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් සාකච්ඡා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | |
| (ආ.) අවශ්‍ය ජීව සංඛ්‍යාන තොරතුරු රැස් කිරීම, රඳවා තබා ගැනීම සහ ආයුගණක සහ වෙනත් අවශ්‍ය පාර්ශවයන් වෙත සැපයීම සඳහා මණ්ඩලය විසින් ජීව සංඛ්‍යාන අංශයක් ස්ථාපිත කර නොතිබුණි. | මණ්ඩලය ජීව සංඛ්‍යාන අංශයක් ස්ථාපිත කර නොතිබුණි. නමුත් මූල්‍ය අංශය මගින් අදාළ දත්ත ලබා දෙනු ලැබේ. | ජීව සංඛ්‍යාන කාර්යයෙහි ඵලදායී ක්‍රියාකාරීත්වය කළමනාකාරීත්වය විසින් සහතික කළ යුතුය. |
| (ඇ.) ප්‍රතිරක්ෂණ හිමිකම් ක්‍රියාවලිය හැසිරවීමට සහ ගෙවිය යුතු වගකීම් හඳුනා ගැනීමට මණ්ඩලය සඳහා ලේඛනගත ප්‍රතිපත්තියක් නොතිබුණි. එබැවින්, මණ්ඩලය ප්‍රාථමික දැනුම් දීමේ ලේඛනයෙන් ප්‍රතිරක්ෂණ වගකීම හඳුනාගෙන වාර්තා කරනු ලබයි. | දැනට මූලික දැනුම් දීමේ ලේඛනය මත පදනම්ව හිමිකම් සඳහා වෙන්කිරීම් සිදු කරනු ලැබේ. කෙසේ වෙතත්, ව්‍යාපාරයේ ස්වභාවය අනුව තාක්ෂණික අදහස්, අලාභ ගැලපුම් වාර්තා යනාදිය ලැබීමෙන් පසුව අවසාන හිමිකම් ප්‍රමාණය තීරණය කරනු ලබයි. තවද, නව ප්‍රතිරක්‍ෂණ හිමිකම් හැසිරවීමේ පද්ධතියක් අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද අතර සියලුම දැනුම්දීම් පද්ධතිය හරහා යාවත්කාලීන වේ.. | අරමුදලේ ප්‍රධාන කාර්යයන් සඳහා ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම කළමනාකාරීත්වය විසින් සහතික කළ යුතුය. |
| (ඈ.) කාර්යක්ෂම පිරික්සුම් පද්ධතියක් සහ අග්‍රහාර හිමිකම් අයදුම්පත් සඳහා ගෙවීම් ක්‍රියාවලියක් නොමැතිකම හේතුවෙන් අග්‍රහාර ප්‍රතිලාභ ගෙවීමේ දීර්ඝ ප්‍රමාදයක් පවතින බව නිරීක්ෂණය විය. අග්‍රහාර හිමිකම් ප්‍රතිලාභ ගෙවීම සඳහා ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි නොකිරීම සහ ලැබුණු දිනය අනුව ඒවා භාර නොගැනීම, ලැබුණු අවස්ථාවේදී එහි නිරවද්‍යතාවය පරීක්ෂා කර නොගැනීම, හිමිකම් ඉල්ලුම්පත්‍ර ලැබුණු බවට ලිඛිත සහතිකයක් ලබා නොදීම සහ පරිගණක පද්ධතියේ දුර්වලතා සහ අභ්‍යන්තර පාලන ගැටළු ආදිය නිරීක්ෂණය විය. තවද, නියැදි විගණනයට අනුව දෛනිකව ගෙවනු ලබන ප්‍රතිලාභ අයදුම්පත්වලින් 40%ක් දෝෂ රහිත අයදුම්පත් වන අතර 60%ක් දෝෂ සහිත අයදුම්පත් බව නිරීක්ෂණය විය. 2005 මැයි 18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 හි 7 (ii) වගන්තියට අනුව, මෙම ප්‍රතිලාභ වැඩ කරන දින 10ක් ඇතුළත | දැනට, කවුන්ටර වෙත ඉදිරිපත් කරන ලද අග්‍රහාර හිමිකම් අයදුම්පත් පරීක්ෂා කර භාර ගන්නා අතර සති දෙකක් ඇතුළත ගෙවීම් සිදු කෙරේ. වැරදි අයදුම්පත් හැසිරවීම සඳහා ද එම ක්‍රියාපටිපාටිය අනුගමනය කරනු ලැබේ. වර්තමානයේ තැපැල් මගින් ලැබෙන අයදුම්පත් සඳහාද පහත පරිදි කටයුතු කිරීමට මෙම ක්‍රියාවලිය තවදුරටත් වැඩිදියුණු කිරීමට සැලසුම් කර ඇත.<br>- තැපෑලෙන් ලැබෙන අග්‍රහාර හිමිකම් අයදුම්පත් පරීක්ෂා කර භාර ගැනීම.<br>- අවශ්‍ය ලියකියවිලි සමඟ නිසි | කළමනාකාරීත්වය තම අභ්‍යන්තර හිමිකම් හැසිරවීමේ ක්‍රියා පටිපාටිය වැඩිදියුණු කිරීමෙන් හිමිකම් හැසිරවීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම. |

| | | |
|---|---|---|
| ගෙවිය යුතුය. කෙසේ වෙතත්, දෝෂ රහිත අයදුම්පත් සඳහා හිමිකම් ගෙවීමට සාමාන්‍යයෙන් දින 40ක් පමණ ගත වන අතර දෝෂ සහිත අයදුම්පත් සඳහා වසරකට (දින 420) වැඩි කාලයක් ගතවේ. | පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරගත් බවට ලේඛනයක් නිකුත් කිරීම.<br>- පළමු පියවරේදී අසම්පූර්ණ හිමිකම් අයදුම්පත් සඳහා වැඩිදුර ලියකියවිලි ඉල්ලා ලිපියක් යැවීමට කටයුතු කිරීම.<br>- එසේම, ඉදිරි සති දෙක තුළ ගෙවීම් පසුබෑමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා, වෙනම කණ්ඩායමක් යෙදවීම.<br><br>- පරිගණක පද්ධතියේ කිසියම් දෝෂයක් ඇති වූ විට, එම දෝෂය තොරතුරු තාක්ෂණ අංශය මගින් නිවැරදි කරනු ලබන අතර එම දෝෂ අවම කර ගැනීමට සහ අභ්‍යන්තර පාලන සඳහා යම් සීමාවන් ඇති කිරීමට පද්ධතියේ වර්ධනයන් සිදු කිරීම. | |
| (ඉ.) ජාතික රක්ෂණ භාර අරමුදල මගින් සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත ගෙවිය යුතු රු. 71,478,209 ක අවසන් රක්ෂණ හිමිකම් නොගෙවීම හේතුවෙන් ප්‍රාථමික රක්ෂණ සමාගම්වලින් මණ්ඩලයට අයකර ගැනීමට තිබූ රු. 2,046,620,122 ක මුදල 2022 ජනවාරි සිට 2023 මාර්තු දක්වා මාස 15 ක් නොපියවා තිබුණි. මේ හේතුවෙන් මණ්ඩලයට අහිමි වූ පොලී ආදායම රු. 567,853,300 කි. | මණ්ඩලය විසින් පිළිතුරු සැපයිය යුතුව ඇත. | මණ්ඩලයට සිදුවන පාඩු වළක්වා ගැනීම සඳහා ප්‍රාථමික රක්ෂණ සමාගම්වලින් රක්ෂණ වාරික අයකර ගැනීම සඳහා මණ්ඩලය විසින් ප්‍රාථමික රක්ෂණ සමාගම් වෙත රක්ෂණ හිමිකම් කාලීනව ගෙවිය යුතුය.. |
| (ඊ.) 2012 දෙසැම්බර් 21 දිනැති අංක 1791/4 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව, සෑම සාමාන්‍ය ප්‍රති-රක්ෂණයකින්ම පැන නගින සම්පූර්ණ වගකීම් සඳහා සාමාන්‍ය රක්ෂණකරු විසින් ගෙවිය යුතු ප්‍රතිශතය ලෙස සියයට තිහක් ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය සමග ප්‍රතිරක්ෂණය කළ යුතුව ඇත. කෙසේ වෙතත්, විධිමත් අධ්‍යයනයකින් තොරව, 2009 වර්ෂයේදී ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය විසින් භාර ගන්නා ලද ප්‍රතිරක්ෂණ වගකීම උපරිම වශයෙන් රු. බිලියන 5 ක් වූ අතර, 2020 ජුනි 12 දින පැවති අංක 163-06 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී එය රු. බිලියන 7.5 ක් ලෙස | මණ්ඩලය විසින් පිළිතුරු සැපයිය යුතුව ඇත. | අවදානම් සහ ලාභදායිත්වය වඩා හොඳින් කළමනාකරණය කිරීම සඳහා සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙතින් රක්ෂණ අවදානම භාර ගැනීමේදී මණ්ඩලය විචක්ෂණශීලීව ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| සංශෝධනය කර ඇත. මේ හේතුවෙන් ඉහත ගැසට් පත්‍රයට අනුව ප්‍රතිරක්ෂණ ගිවිසුම් වලින් සියයට තිහක අවදානම භාර නොගන්නා අතර මේ හේතුවෙන් මණ්ඩලයට 2021 සහ 2022 වසරවලදී පමණක් අහිමි වූ මුළු ආදායම රු. මිලියන 657.2 කි. | | |
| (ඇ.) සේවාලාභීන් සඳහා ගුණාත්මක හා කඩිනම් සේවාවක් සැපයීම සඳහා රුපියල් මිලියන 21.5ක් වැයකර අංග සම්පූර්ණ ඇමතුම් මධ්‍යස්ථානයක් 2021 වර්ෂයේදී ඉදි කර තිබුණි. එමගින් එකවර සේවාලාභීන් 15 දෙනෙකු සඳහා සේවා සැපයීමට හැකියාව පවතී. වර්තමානය වන විට සාමාන්‍යයෙන් දිනකට ලැබෙන දුරකථන ඇමතුම් සංඛ්‍යාව 1700ක් පමණ වන බව නිරීක්ෂණය වූ අතර, දුරකථන ඇමතුම් මධ්‍යස්ථානය පිහිට වූ දින (2021 පෙබරවාරි) සිට 2022 දෙසැම්බර් දක්වා ඇමතුම් මධස්ථානයට ලද මුළු ඇමතුම් සංඛ්‍යාව 734,626 කි. ඉන් ප්‍රතිචාර දැක්වූ මුළු ඇමතුම් සංඛ්‍යාව 312, 350ක් වන අතර ප්‍රතික්ෂේප වූ ඇමතුම් සංඛ්‍යාව 422,250 කි. ඒ අනුව පසුගිය වර්ෂ දෙක තුළ ඇමතුම් මධස්ථානයට ලද මුළු ඇමතුම් සංඛ්‍යාවෙන් සියයට පනස් හතක් (57%) ක් ම ප්‍රතිචාර දැක්වීමට නොහැකිව ප්‍රතික්ෂේප වී තිබුණි. එම නිසා සේවාලාභීන් විසින් තම ගැටළු හා ලබාදෙන සේවා පිළිබඳව තම අප්‍රසාදය ආයතනික නිල සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රකාශ කර තිබූ බව නිරීක්ෂණය විය. මේ පිළිබඳව කළ පරීක්ෂාවේදී අනාවරණය වූයේ ප්‍රමාණවත් හා පුහුණු කාර්ය මණ්ඩලයක් ඇමතුම් මධ්‍යස්ථානයට අනුයුක්ත කිරීමට අරමුදලේ කළමනාකාරීත්වය අපොහොසත් වී ඇති බවයි. ඇමතුම් මධ්‍යස්ථානය තුළ පරිශීලකයන් 15 දෙනෙකු සඳහා පහසුකම් සපයා තිබුණද, විගණනය කළ ඇතැම් දිනයන්හි භෞතික නිරීක්ෂණයන්ට අනුව ඇමතුම් මධ්‍යස්ථානයේ සේවා නියුක්ත නිලධාරීන් ගණන 4-5ක් වැනි සුළු පිරිසක් බව නිරීක්ෂණය විය. තවද, ඇමතුම් මධස්ථානය වෙත ලැබෙන ඇමතුම් ප්‍රමාණය දිනෙන් දින ඉහළ යාමට හේතුව, අග්‍රහාර ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වන අයදුම්පත්‍ර සඳහා සාධාරණ කාලයක් තුළ ගෙවීම් නොකිරීම බව නිරීක්ෂණය විය. | දැනට, ඇමතුම් මධ්‍යස්ථානය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වේ. මීට පෙර, අග්‍රහාර හිමිකම් ගෙවීම් විශාල ප්‍රමාණයක් ගොඩගැසීම නිසා, ඇමතුම් මධ්‍යස්ථානයට ලැබුණු ඇමතුම්වලින් 50% ක් ස්වයංක්‍රීයව අතහැර දමා ඇත. කෙසේ වෙතත්, දැනට, පසුබෑම අවම කර ඇති අතර ප්‍රමාණවත් දුරකථන ක්‍රියාකරුවන් අනුයුක්තයි කර ඇත. එබැවින්, ඇමතුම් මධ්‍යස්ථානයට ලැබෙන ඇමතුම් සංඛ්‍යාව කළමනාකරණය කළ හැකි මට්ටමක පවතී. | කළමනාකාරීත්වය විසින් පාරිභෝගික සේවා හැසිරවීමට සහ හිමිකම් ඉල්ලීම් නියමිත වේලාවට සැකසීමට ඇමතුම් මධ්‍යස්ථානයට ප්‍රමාණවත් සහ නිපුණ මානව සම්පත් අනුයුක්ත කළ යුතුය. |